යුද්ධය විසින් දිර්ඝකාලීන ලෙස සමාජයක ඇතිකරන දෘශ්‍ය අදෘශ්‍ය විපාකයන් මෙතෙක් යැයි ගණනය කළ නොහැකිය. එම විපාකයන් පරම්පරා ගණනාවක් මතින් අදෘශ්‍යව පැවතිය හැක.

එම නිසාවෙන්ම යුධවිරෝධි භාවය සමාජ තුළ ස්ථාපිත කිරීම උදෙසා සියලුම සමාජ ව්‍යුහයන් යොදා ගත යුතුවේ. යුධවිරෝධි බව වූ කලී ප්‍රවේණිගත නොවන ආකාරයට පරම්පරාවෙන් පරම්පරාවට දායාද විය යුතු සංස්කෘතික හැඩ ගැස්මකි. එවැනි ලක්‍ෂණ ජීව විද්‍යාවේ දී හැඳින්වෙන්නේ "මෙමේ" (Meme) නමිනි. මෙමේයක ප්‍රනරුක්තිය හෝ පුනරාවර්තනය හෙවත් නද්‍යකාරය ඇතිවීම, තහවුරු කිරීම හා ශක්තිමත් කිරීම සංකල්පයේම දිගුකල් පැවැත්ම මගින් සහතික වේ. එම හේතුව නිසා මෙමේ භාවය ස්ථාපිත කිරීම උදෙසා කලාව දායක කරගත හැක.

සිනමාව . සම්බන්ධව පවතින මතිමතාන්දර කවරක් වුවද, සිනමාව ඓන්ද්‍රිය සන්නිවේදනය නිසා ඇතිවන තවත් මානසික අත්දැකීමක් බව විද්‍යාඥයන් පෙන්වා දී ඇත.[02] සිනමාව මහජනයා වෙත යොමු කිරීමෙන් ප්‍රකෘති ජීවිතයේ දකින යථාර්ථයට වඩා සිනමා ව්‍යවහාරයන් ලා පෙන්වන යථාර්ථය ගැඹුරු අත්දැකීමකි. සිනමාවේ ශක්‍යතා හා ප්‍රකාශනය සම්පූර්ණයෙන් ප්‍රේක්‍ෂක අත්දැකීම් ප්‍රබලව තහවුරු කිරීමේ අරමුණෙන් යොදාගනු ලැබුවකි.

යුද්ධයත්, සිනමාවත් යන ද්විරූපයට මිනිසාට අදාළය. එය මනුෂ්‍ය ජීවන රටාවට බලපෑම් කරයි. යුද්ධයත්, සිනමාවත් විවිධ ස්වරූපයෙන් මිනිසා මරාදමයි. නැතහොත් මිනිසා ප්‍රතිනිර්මාණය කරයි. මිනිසාට මෙතරම් ප්‍රබල ලෙස බලපෑම් එල්ල කරන මාතෘකාවන් විෂය කර ගැනීම එකී මිනිසාටම බලපෑම් කළහැකි තරමට තියුණු සිනමාව නම් වූ ප්‍රකාශන මාධ්‍යයේ ප්‍රබලත්වය සාක්‍ෂාත් කරන්නකි. යුද්ධය කෙතරම් භාවතීෂය වන්නේ ද, එය සිනමාගත කිරීම 'ද භාවතීෂය කම්පනයකට හේතුවේ. එසේම යුද්ධය දෙස බුද්ධිමත්ව බලන සිනමාකරුවකුගේ අරමුණ තම රසිකයට එකී මාතෘකාව තුළ කිසියම් බුද්ධිමය සංවාදයකට කැඳවීමය.

සිනමා නිර්මාණය රසවිඳින්නා අලුත් මිනිසකු බවට ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව සිනමාකරුවකු සතුය. රටක යුධවිරෝධි මතවාදයන් ගොඩනැඟීමේ මෙහෙවර උදෙසා කලාකරුවා සතු වගකීම සුළුකොට තැකිය හැකි නොවේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් විට පවතින තත්කාලින සමාජ තත්වය තුළ කලාකරුවාගේ ධනාත්මක භූමිකාව වෙනත් යුගයකට වඩා අත්‍යාවශ්‍ය වන බව පැහැදිලිය. මන්ද සිනමා වූ කලී සියුම් කලා මාධ්‍යය මෙන්ම ප්‍රබලතම සන්නිවේදන ශක්‍යතාවයෙන් හෙබි කලා මාධ්‍යය වන බැවිනි.

---

02. සිල්වා චන්දන - .2001- <u>සිනමා රූප රිද්ම</u> - විජේසූරිය ග්‍රන්ථකේද්‍රය, මුල්ලේරියාව, 17 පිටුව